# ‘සිස්ටම් චේන්ජ්’ සඳහා

2022 අරගලයට (போராட்டம்) වසර තුනකට ආසන්න කාලයක් ගත වී ඇත. එහිදී විනාශකාරී ආර්ථික අර්බුදයක් ඇති කළ සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම්, වර්ගවාදය සහ දූෂණ චෝදනා එල්ල වූ රජයක් පෙරළා දැමීමට ශ්‍රී ලංකාවේ ජනතාව බලය අතට ගත්තේ ය.

ජනතා ව්‍යාපාරය විසින් පුළුල් කරන ලද දේශපාලන විඥානයේ පිටුබලය මත ජාතික ජනබලවේගී (NPP) රජය බලයට පත් වී වසරකට ආසන්න කාලයක් ගත වී ඇත. අරගලය අරම්භවූයේ එවකට සිටි ජනාධිපතිවරයා බලයෙන් නෙරපාහැරීමේ ව්‍යාපාරයක් ලෙස වුවද, පසුව, හුදෙක් එක් පුද්ගලයෙක් වෙනුවට තවත් පුද්ගලයෙක් මාරු කිරීම හෝ එකම කාඩ් අත නැවතත් මාරු කිරීමක් වැනි දෙයක් අවශ්‍ය නොවන බව ජනතාව වටහා ගැනීමත් සමග ඔවුන්ගේ ඉල්ලීම් තවදුරටත් පුළුල් විය. ‘සිස්ටම් ජේන්ජ්’ යන්න ඇතම් අවස්ථාවල නිශ්චිත ලෙස අර්ථ දක්වා නොතිබුණත්, විවිධ පුද්ගලයින් එමගින් විවිධ දේ අදහස් කලත් ජනතාව ‘සිස්ටම් ජේන්ජ් කිරීමක්’ ඉල්ලා සිටි අතර ඒ වෙනුවෙන් ඡන්දය ලබා දුන්නේය.

මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය 2025 අප්‍රේල් සහ ජූලි යන මාස දෙක අතර රටේ විවිධ ප්‍රදේශවල ස්ත්‍රී අයිතීන් වෙනුවෙන් කටයුතු කරන ක්‍රියාකාරීන් 25 කට වැඩි පිරිසක් සමඟ සිදු කරන ලද සංවාද සහ වෙනස පිළිබඳ, ඔවුන්ගේ තේරුම් ගැනීම සහ ඔවුන්ගේ අවබෝධය මත පදනම් වී ඇත. එම නිසා සිස්ටම් චේන්ජ් පිළිබද ඔවුන්ගේ දැක්ම, ජනවාර්ගික, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ආර්ථික යුක්තිය මත පදනම් වේ; ධනවාදය, පීතෘ මූලිකත්වය, ජාතිකවාදය සහ මිලිටරිවාදය තුළ සහජයෙන් පවතින ප්‍රචණ්ඩත්වයට අභියෝග කරයි; නිෂ්පාදනය සහ ප්‍රතිනිෂ්පාදනය අතර ද්විමය බෙදීම ප්‍රශ්න කරයි; එසේම ජනවාර්ගිකත්වය, ආබාධිතභාවය, වයස, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය, සමාජ ආර්ථික තත්ත්වය සහ භූගෝලීය පිහිටීම වැනි එකිනෙකා හා ගැටෙන සාධක මගින් ඔවුනගේ අත්දැකීම්, අනන්‍යතාවන් සහ අභියෝග හැඩගස්වා ඇති බව ද අපි හඳුනා ගනිමු.

මෙහිදී අපි කතා කළ ක්‍රියාකාරීන් දායකත්වය දැක්වූ බොහෝ අරගලවලින් අපි උත්තේජනයක් ලැබූ අතර, ඒවා 2022 අරගලයට බොහෝ කාලයකට පෙර ආරම්භ වී තවමත් දිගටම කරගෙන යන ඒවා විය. අපි ඔවුන්ගේ අරගල වලට සහයෝගීතාවය දක්වමින් ලියන්නෙමු. එහෙත්, මෙම සංක්ෂිප්තය ඔවුන් වෙනුවෙන් කතා කිරීම හෝ ඔවුන් නියෝජනය කිරීම නොකරන අතර, මෙය මුළු ශ්‍රී ලංකාවේ ම සියලුම ස්ත්‍රීන්ගේ සියලු ඉල්ලීම් පිළිබඳ සවිස්තරව ඉදිරිපත් කිරීමක් ද නොවේ. එසේම, බොහෝ ස්ත්‍රීන්ගේ සහ පුරවැසියන්ගේ ජීවිතවලට පුළුල් ලෙස බලපාන වැදගත් අංශ දෙකක් වන සෞඛ්‍ය සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් ද මෙම සංක්ෂිප්තයෙන් විස්තරාත්මකව ඉදිරිපත් කර නොමැත. මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තයේ ඇතුළත් වෙනස පිළිබඳ දැක්ම, ‘ස්ත්‍රීන්ගේ ප්‍රශ්න’ ලෙස සලකනු ලැබූ සහ ලබන කාරණාවලට පමණක් සීමා නොවේ. තවද, ස්ත්‍රීන් යනු සමජාතීය කාණ්ඩයක් නොවන බව මෙහිදී අපි හඳුනා ගනිමු; “ස්ත්‍රීන්” යන්නෙන් අපි අදහස් කරන්නේ ස්ත්‍රියක් ලෙස තමන් හඳුනා ගන්නා, උපතේදී තමන් ස්ත්‍රියක් ලෙස නම් කරන ලැබූ සහ queer ස්ත්‍රීන් ය (queer ස්ත්‍රීන් ලෙස හඳුනා ගන්නේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය විෂම ලිංගික හෝ සිස්ජෙන්ඩර් වීමේ සම්මතයන්ට අනුකූල නොවන ස්ත්‍රීන් ලෙසය). ස්ත්‍රීන්ගේ විවිධ අත්දැකීම් අවධාරණය කිරීම සහ සමාජයේ බොහෝ කොටස් මුහුණ දෙන සමාජ, දේශපාලන, පෞද්ගලික සහ ආර්ථික අසාධාරණකම් සහ අසමානතාවයන් යන එකිනෙක හා සබැඳි කාරණා සොයාබැලීමට අපි මෙහිදී උත්සාහ කරන්නෙමු. එසේම අපගේ ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා දිගුකාලීන ඉල්ලීම්වලට ද අපි මෙහිදී පුළුල් සහයෝගයක් ලබා දෙන්නෙමු.

මෙහි දක්වා ඇති නිර්දේශයන් බොහොමයක්, ස්ත්‍රීන්ට එරෙහිව සිදුවන සියලුම ආකාරයේ වෙනස්කම් ඉවත් කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය (CEDAW) යටතේ ශ්‍රී ලංකාවේ එකඟතා සහ 2025 පෙබරවාරි මාසයේදී නිකුත් කරන ලද CEDAW කමිටුවේ අවසාන නිරීක්ෂණ සමග අනුකූල වේ.

මෙම ලේඛනය, 2024 ජනාධිපතිවරණයට පෙර ජාතික ජන බලවේගය (NPP) විසින් නිකුත් කරන ලද “පොහොසත් රටක් ලස්සන ජීවිතයක්” යන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ලබා දුන් පොරොන්දු පිළිබඳව එම රජයට මතක් කිරීමකි. එය රාජ්‍යය සහ පුරවැසියන් අතර ඇති නව සමාජ ගිවිසුමක පොරොන්දුවක් වේ. එනම්, දේශපාලන ප්‍රතිපත්ති ප්‍රකාශනවල ඇති පොරොන්දු මැතිවරණ කටයුතු සඳහා පමණක් යොදාගෙන පසුව ඉවත නොදැමිය යුතු බවයි.

**සමාජ විද්‍යාඥයින්ගේ සංගමය**
**නොවැම්බර් 2025**

# බලය, දේශපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය

ශ්‍රී ලංකාව බහු ප්‍රජාතන්ත්‍රවාදී, නමුත් සුළුතරයන්ගේ අයිතිවාසිකම් නොසලකා හරින රටක් වේ. එක් මැතිවරණයක් අවසන් වීමෙන් පසු සහ ඊළඟ මැතිවරණය සිදුවීමට පෙර කාලය තුළ ජනතාවට හඬක් නොමැති අතර, රාජ්‍යයේ ස්වභාවය හේතුවෙන් බලය මධ්‍යගත වීම සහ සම්පත් අසාධාරණ ලෙස බෙදා වෙන් කිරීම සිදුවේ.

- 1978 දී ජේ. ආර්. ජයවර්ධන විසින් හඳුන්වා දුන් **විධායක ජනාධිපති ධුරය** සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම අතර ඇත්තේ සමානකම් කිහිපයක් පමණි. පෙර ආණ්ඩු සහ NPP ද බලයට පැමිණ ඇත්තේ විධායක ජනාධිපති ධුරයේ ඇති අවාසි ගෙනහැර දක්වමින් එය අහෝසි කරන බවට පොරොන්දු වෙමිනි. පෙර ආණ්ඩු බලයට බලයට පත්වීමෙන් පසු ඔවුන්ගේ පොරොන්දුව පාවා දී ඇත. NPP ආණ්ඩුව පොරොන්දු වූ පරිදි මෙම ශාපය අවසන් කරයිද?

- 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සහ 1987 පළාත් සභා පනතෙන් ඔබ්බට **බලය බෙදා ගැනීම**, දෙමළ ජනතාවගේ දිගුකාලීන ඉල්ලීමකි. අර්ථවත් බලය බෙදා හැරීමක් මගින් සියලුම පළාත්වල සියලුම ජනතාවට ප්‍රතිලාභ ලැබිය හැකි වුවද, එය තවමත් ඉටු වී නොමැත.


- මැතිවරණ අතරතුර තමන්ගේම කටයුතු කළමනාකරණයට සහභාගී වීමට සහ තමන් බලයට පත් කරගත් නියෝජිතයන් තම ක්‍රියා සඳහා වගකීම භාරගන්නා බවට සහතික කර ගැනීමට පුරවැසියන්ට අවස්ථා තිබිය යුතුය. මැතිවරණවලින් ඔබ්බට, ජනතා බලය ජනතා අරගලයේ ප්‍රධාන ඉල්ලීමක් විය. ජාතික ජන බලවේගය සිය මැතිවරණ ප්‍රකාශනයේ සහ මැතිවරණ ව්‍යාපාරයේදී මහජන සහභාගීත්වය සඳහා ඇති ඉල්ලීම පිළිගත් නමුත් ඒ සම්බන්ධයෙන් ස්ථාවර යෝජනාවලීන් කිසිවක් ඉදිරිපත් කර නැත. සමාජ, ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍රවල පවතින ආන්තීකරණය සහ බැහැර කිරීම ජය ගැනීම සඳහා, ආන්තිකකරණයට ලක් වූ සහ බැහැර කිරීම්වලට ලක් වූවන් හට අර්ථවත් නියෝජනයක් සහ සහභාගීත්වයක් තිබිය යුතුය. මේ නිසාවෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයෙන් යුත් සහභාගීත්ව අය-වැයකරණය ඇතුළුව ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ලතින් ඇමරිකාවේ සහ අනෙකුත් ප්‍රාදේශීය ප්‍රජාතාන්ත්‍රවාදී අත්දැකීම්වලින් ජාතික ජන බලවේගී (NPP) රජය පාඩම් ඉගෙන ගත යුතුය.

- තේරී පත් වූ දේශපාලන ආයතන තවමත් **පිරිමින්ගේ ආධිපත්‍යයෙන්** පවතී. 2024[1] දී පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 5.3% සිට 9.8% දක්වා ඉහළ යාම, ශ්‍රී ලාංකික ප්‍රමිතීන්ට අනුව එය සැලකිය යුතු වැඩිවීමකි. නමුත්, එය තවමත් දකුණු ආසියානු සාමාන්‍යය අගය වන ආසන්න වශයෙන් 22%[2] කට වඩා අඩු ය. දේශපාලන පක්ෂල තවමත් ස්ත්‍රීන්ගේ දේශපාලන නායකත්වයට විරුද්ධව අවකාශයන් ලෙස පවතී. දේශපාලනය තුළ ස්ත්‍රීන් ආන්තීකරණයට ලක්කිරීම සමාජයේ ස්ථාපිත වී ඇත්තේ, ගැඹුරින් මුල් බැසගත් සමාජ සම්මතයන්, ඔවුන්ගේ භූමිකාවන් සහ හැසිරීම් පිළිබඳ ස්ත්‍රී පුරුෂභාවී අපේක්ෂාවන් තුළ ය.. එබැවින්, දිගුකල් පවත්නා සම්මතයන් වෙනසක් හරහා මේවා ආමන්ත්‍රණය නොකළහොත්, පොදු ජීවිතය තුළ ස්ත්‍රීන්ගේ පැවැත්ම ඉහළ නැංවීමට ඔවුන්ගේ පරිවර්තනීය හෝ ව්‍යූහාත්මක වෙනසකට තුඩු දෙන කිසිදු තනි උත්සාහයක් හෝ මෙවලමක් හෝ කල් පවතින වෙනසක් ඇති නොවනු ඇත.

1 Juhola, A. (2025, January 16). The visibility of women in Sri Lankan politics is increasing. Demo Finland. https://demofinland.org/en/the-visibility-of-women-in-sri-lankan-politics-is-increasing/

2 Inter-Parliamentary Union and UN Women. (2025). Women in Politics:2025. https://www.unwomen.org/en/digital-library/publications/2025/03/women-in-politics-map-2025

**පාර්ලිමේන්තු නියෝජනය**




- ලංකාවේ **මිලිටරිකරණය** අවම වශයෙන් 1976 සිට රාජ්‍ය ව්‍යුහයේ සහ සමාජයේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස පැවතුණ අතර, යුද්ධය අවසන් වී වසර 15 කට පසුවත් එය එසේම පවතී. ආරක්ෂාව යන්න අදහස් කරනු ලබන්නේ මුරපොළවල්, කඳවුරු, සෝදිසි කිරීම් සහ ආයුධ සන්නද්ධ මිනිසුන් හරහා ය. එසේම උතුරු හා නැගෙනහිර සිවිල් ඉඩම් අඛණ්ඩව අත්පත් කර ගැනීම සාධාරණීකරණය කිරීම සඳහා ය. පුද්ගලයන් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට සහ රඳවා තබා ගැනීමට ඉඩ සලසන **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට (PTA)** විරුද්ධ වූ NPP විසින් එය තවමත් ක්‍රියාත්මක කරයි.

- **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත**, මගින් චූදිතයාගේ නිසි ක්‍රියා පටිපාටිය සහ නීතිය ඉදිරියේ සමානාත්මතාවය සඳහා වන අයිතීන් යටපත් කරයි. මෙහිදී යුද්ධයේදී දිවි ගලවා ගත් ප්‍රජාවන්ගේ (**survivors**) සහ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් ලැබෙන ප්‍රධාන ඉල්ලීමක් වන්නේ මිලිටරිකරණය ඉවත් කිරීම සහ ත්‍රස්තවාදී නීති අවලංගු කිරීම ය.

- 2016 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ (PSC) නිර්දේශ මත පදනම් වූ **විධායක ජනාධිපති ධුරය** අහෝසි කිරීම.

- කලාප සමඟ **බලය බෙදා ගැනීම** පිළිබඳ **ජාතික එකඟතාවයක්** ගොඩනැගීම.

- ප්‍රාදේශීය, පළාත් සහ ජාතික මට්ටමින් **පුරවැසියන් විසින් මෙහෙයවන තීරණ ගැනීම්** වෙනුවෙන් වූ නවෝත්පාදන යාන්ත්‍රණ ඇති කිරීම.

- පාර්ලිමේන්තුවේ ස්ත්‍රීන් සඳහා 30% **කෝටාවක්** හඳුන්වා දීම සහ දේශපාලන පක්ෂවල තීරණ ගැනීමේ තනතුරුවලට අවම වශයෙන් 30% ක් ස්ත්‍රීන් පත් කිරීම.

- **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත** දැන්ම **අවලංගු කර**, එය අවලංගු කරන තෙක් එය තවදුරටත් භාවිතය වැළැක්වීම සඳහා වහාම **තාවකාලික තහනමක් පැනවීම.**

- හමුදාව සහ පොලිසිය විසින් අත්පත් කරගත් සියලුම **සිවිල් ඉඩම්, දේපළ සහ නිවාස** නිදහස් කිරීම.

- සමාජ ක්‍රියාකාරීන්ට එරෙහිව කෙරෙන **සෝදිසි කිරීම්** සහ **හිරිහැර නතර කිරීම.**

- කෘෂිකර්මාන්තය සහ සංචාරක ව්‍යාපාරය වැනි වාණිජ අංශවල මෙන්ම අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි සමාජ අංශවල **හමුදා සහභාගීත්වය** අවසන් කිරීම.

- **හමුදා කඳවුරු** සහ **මුරපොළවල් ඉවත් කිරීම** සහ, හිටපු සේවා නිලධාරීන් ඉවත් කර නැවත **සමාජගත කිරීම.**

# ණය, ආහාර සුරක්ෂිතතාව, ජීවන වියදම

2024 මැතිවරණයෙන් පසු, NPP රජය, පෙර රජය විසින් ආරම්භ කරන ලද IMF-සහාය **ලත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ** ගනුදෙනුව අවසන් කළේය. මෙය, බාහිර ණය වලින් 30% කට වඩා හිමි ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් (ISBs) ඇතුළු ප්‍රධාන ණය හිමියන් සමඟ වූ අර්බුදයේ සාධාරණ මාර්ගයක් වසා දැමුණි. ණය සේවා සැපයීම සඳහා රජයේ ආදායම උපරිම කිරීම සඳහා IMF කප්පාදු කොන්දේසි යටතේ, දුප්පතුන්ගේ බදු බර වැඩි කර ඇත; බලශක්ති මිල මෙන්ම අත්‍යවශ්‍ය ආහාර සහ ඖෂධවල මිල ඉහළ නංවා ඇත. එමෙන්ම ස්ත්‍රීන් මත වැටුප් රහිත සුරැකුම් සේවා බර වැඩිකර ඇති අතර මෙම තත්ත්වය විශේෂයෙන්ම දුප්පත් ස්ත්‍රීන්ට අවාසනාවන්ත ලෙස බලපෑවේ ය.

- දේශපාලනඥයින්, **ප්‍රතිපත්ති සම්පාදකයින්** සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන අපව ඇද දැමූ ණය උගුල **අයුක්තියේ යාන්ත්‍රණයකි**. එනම්, මහජන සේවාවන් සඳහා භාවිතා කළ යුතු මුදල් සහ සම්පත් පැහැර ගැනීම, ආදායම් සහ ධන අසමානතාවය වඩා නරක අතට හැරීම සහ ජාතික සම්පත් මත ප්‍රජාතන්ත්‍රවාදී පාලනය අඩපණ කිරීමයි. මෙම ණයෙන් වැඩි කොටසක් නීත්‍යානුකූල නොවන අතර, එමගින් කිසිදු මහජන ප්‍රතිලාභයක් නොලැබේ. එමෙන්ම එය දූෂිතයින්ගේ සාක්කු පිරවීම සහ ඵලදායී නොවන සහ/හෝ පරිසරයට හානිකර 'සංවර්ධනයට' මුදල් සැපයීමකි. මේ අතර, අපනයන ආදායම් සහ අතිරික්ත ලාභ වලින් ඩොලර් බිලියන ගණනක් බහුජාතික සමාගම් සහ ධනවතුන් විසින් නීති විරෝධී මූල්‍ය ප්‍රවාහයන් මගින් විදේශගත කරනු ලැබේ.

- **ස්වෛරී ණය ගෘහස්ථ ණය සමඟ සමීපව සම්බන්ධ වන අතර**, බාහිර ණය ආපසු ගෙවීම රැකියාවන්ට, ජීවනෝපායන්ට සහ සමාජ ආරක්ෂාවට දේශීය සම්පත් බලමුළු ගැන්වීමට අවශ්‍ය මූල්‍ය අවකාශය අඩු කරයි. රාජ්‍යය විසින් අතහැර දමා ඇති දුප්පත් පවුල් තමන්ගේම ණය උගුලට හසු වන අතර, දෛනික පරිභෝජනය, අනපේක්ෂිත වියදම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් වෙනුවෙන් ඔවුන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගනී. ස්ත්‍රීන් කෙසේ හෝ තම ණය ආපසු ගෙවීමට ක්‍රම සොයා ගන්නා අතර, එහිදී රන් ආභරණ උකස් කිරීම, මිතුරන්ගෙන් සහ ඥාතීන්ගෙන් සහ අවිධිමත් ණය දෙන්නන්ගෙන් මුදල් ණයට ගැනීම සිදු කරයි. මෙයින් ස්ත්‍රීන් තවදුරටත් ණය බර වෙතටම තල්ලු කරයි. ක්ෂුද්‍ර මූල්‍ය ණය කර්මාන්තය ග්‍රාමීය ස්ත්‍රීන් බලගන්වන බවට පොරොන්දු වුවද, ඇත්ත වශයෙන්ම මුදල් විනාශ වීම, බලාපොරොත්තු සුන්වීම සහ සියදිවි නසාගැනීමට හේතු වී ඇත. පුද්ගලයින් මිලියන 2.8 ක් පුද්ගලයින් කොල්ලකාරී ක්ෂුද්‍ර මූල්‍ය ණයවලින් කොටු වී සිටින අතර, ඉන් මිලියන 2.4 ක් ස්ත්‍රීන්[3] වේ.

ක්ෂුද්‍ර මූල්‍ය ණය





3 13.02.2024.The Sectoral Oversight Committee on Alleviating the Impact of the Economic Crisis focus on the parties aggrieved by the impact of the micro finance crisis in Sri Lanka, Parliament of Sri Lanka, https://www.parliament.lk/news-en/view/3897#:~:text=Addressing%20those%20present%2C%20the%20Sri,of%20which%2024%2C000%2C000%20are%20women

- 2022 සිට ආහාර මිල 73%[4] කින් ඉහළ ගොස් ඇති බැවින්, කුටුම්භවලින් 70% ක් **ආහාර පරිභෝජනය** අඩු කර ඇති අතර, ආහාරවේල් මඟ හැරීම ද ඊට ඇතුළත් ය. 2022 ඔක්තෝම්බර් මාසයේදී පවුල් මිලියන 3.9 ක් (ශ්‍රී ලාංකික කුටුම්භවලින් 57.5%)[5] යම් ආකාරයක මූල්‍ය ආධාරයක් ඉල්ලා සිටින ලදී. කෙසේ නමුත්, මුදල් සහ/හෝ ආහාර සලාක සුළු වශයෙන් බෙදා හැරීම වෙනුවට, අවශ්‍ය වන්නේ මූලික ආහාරවල මිල පාලනය කිරීම; පොදු බෙදාහැරීමේ පද්ධතිය යථා තත්ත්වයට පත් කිරීම; සහ ගැබිනි සහ තරුණ මව්වරුන්ගේ, ළදරුවන්ගේ සහ පාසල් දරුවන්ගේ සහ වැඩිහිටියන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මෙම ආර්ථික අර්බුදය හේතුවෙන් තම දරුවන්ට ප්‍රමුඛත්වය දෙමින් ස්ත්‍රීන් තමන්ගේම පෝෂණය අඩු කර ගැනීමට  සිදුවී ඇත.

- මෙම අර්බුදයට මුහුණ දීමේදී, කුඩා ගොවීන් වන බොහෝ ස්ත්‍රීන් කේන්ද්‍ර කරගත්, දේශීය ආහාර නිෂ්පාදනය, බෙදා හැරීම සහ හුවමාරු කිරීමේ සාධාරණ හා තිරසාර ආකෘතියක් අවධාරණය කරන ආහාර ස්වෛරීභාවයට ප්‍රමුඛත්වය දීම අවශ්‍ය වේ.

- ස්ත්‍රීන් කෘෂිකර්මාන්තයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළත්, ගොවීන් ලෙස ඔවුන්ගේ භූමිකාව සඳහා පිළිගැනීමක් නොලැබේ. ශ්‍රී ලංකාවේ පෞද්ගලික ඉඩම් හිමිකරුවන්ගෙන් 16% ක් පමණක් ස්ත්‍රීන් වේ[6]. **ඉඩම් හිමිකම**, ගොවි සංගම් සාමාජිකත්වයට ඉතා ප්‍රධාන කාරණයක් වන අතර එමගින් කෘෂිකර්ම ව්‍යාප්ති සේවා, පොහොර, ජලය සහ වගාව පිළිබඳ තීරණ ගැනීමේ බලය හිමි වේ. කාර්මික විදේශීය යෙදවුම් මත යැපෙන කෘෂිකර්මාන්තය මගින් යටත් විජිතකරණය වූ පරිසර පද්ධතියක, සාම්ප්‍රදායික ශාක ප්‍රභේදවල පැවැත්ම සහ සම්ප්‍රේෂණය සහතික කරමින්, සෑම නව අස්වැන්නක් සඳහාම දේශීය බීජ සංරක්ෂණය කරන්නන් ලෙස ස්ත්‍රීන් සාම්ප්‍රදායික ආහාර දැනුමේ භාරකරුවන් වේ. එබැවින්, ආහාර ස්වෛරීභාවය කරා මාරුවීමට නායකත්වය දෙන සහ පවත්වා ගෙන යන අය ස්ත්‍රීන් ය.




4 Household Survey on Impact of Economic Crisis - 2023, Department of Census and Statistics & Ministry of Finance, Planning and Economic Development, Sri Lanka, https://www.statistics.gov.lk/WebReleases/HECS_Bulletin_Final

5 Feminist Collective for Economic Justice 2023. (March 8). International Women's Day: Sri Lankan Women Demand Democracy, Economic Justice, and Freedom. Polity 11(1): 47.

6 Kamdar, B. (2021, March 9). Gendered Land: Sri Lankan Women Battle Unequal Access to Resources. https://thediplomat.com/2021/03/gendered-land-sri-lankan-women-battle-unequal-access-to-resources/

- නීත්‍යානුකූල නොවන හෝ සාහසික අනිසි ණය (odious debts) හඳුනා ගැනීම සඳහා පුරවැසි සහභාගීත්වයෙන් රාජ්‍ය ණය (public debt) විගණනය කිරීම.

- මහජන විගණනයේ ප්‍රතිඵලය ලැබෙන තෙක් **ණය ආපසු ගෙවීම අත්හිටුවීම.**

- සියලුම **ක්ෂුද්‍ර මූල්‍ය ණය ආපසු ගෙවීම සඳහා තාවකාලික තහනමක්**, ක්ෂුද්‍ර මූල්‍ය ණය වින්දිතයින්ට එරෙහිව ගන්නා ලද සියලුම නීතිමය ක්‍රියාමාර්ග වහාම නතර කිරීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය අවලංගු කිරීම.

- ග්‍රාමීය ප්‍රජාවන් සඳහා දැරිය හැකි ණය **ප්‍රභවයන් වෙත ප්‍රවේශය** වීම.

- **ස්ත්‍රීන්ට ඉඩම් හිමිකම** සහ කෘෂිකාර්මික සම්පත් සහ පිරිමින් මෙන් **සංගම්** ඇති **කර ගැනීමට සමාන ප්‍රවේශයක්** ලබා දීම.

- අත්‍යවශ්‍ය භාණ්ඩ සහ අත්‍යවශ්‍ය ආහාර **මිල නියම කිරීමේදී රාජ්‍ය මැදිහත්වීම.**

- අවුරුදු 60 ට වැඩි වැඩිහිටියන්, අවුරුදු 05 ට අඩු ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සඳහා අනිවාර්ය අතිරේක ප්‍රතිපාදන සහිත **සර්ව සමාජ ආරක්ෂාවක්** ලබා දීම.

- **ප්‍රගතිශීලී සෘජු බදු ක්‍රමයක්** සහ ආහාර ද්‍රව්‍ය, පාසල් සැපයුම් ද්‍රව්‍ය, ඖෂධ සහ සෞඛ්‍ය සැපයුම්, පොත්පත් ආදිය ඇතුළු අත්‍යවශ්‍ය අයිතම සඳහා **වැට් බද්ද ඉවත් කිරීම.**

# වැටුප් සහිත රැකියා

**ශ්‍රී ලංකාවේ විධිමත් ශ්‍රම බලකායෙන් 34% ක් පමණ ස්ත්‍රීන් වේ**[7]. රාජ්‍ය අංශයට (**public sector**) (සෞඛ්‍ය, අධ්‍යාපනය, රජයේ සේවා) අමතරව, සංක්‍රමණික ප්‍රේෂණ, ඇඟළුම්, තේ සහ රබර් වලින් ලැබෙන විදේශ විනිමය ඉපැයීම් හරහා ආර්ථිකය පවත්වා ගෙන යන අංශවල කොඳු නාරටිය වන්නේ ස්ත්‍රීන් ය.

## ශ්‍රී ලංකාවේ විධිමත් ශ්‍රම බලකායෙන් 34% ක් පමණ ස්ත්‍රීන් වේ

7 Perera, B. M. (2024). Shrinking labour force: Economic impact and necessary reforms. The Morning. 27 October 2024, https://www.themorning.lk/articles/j59zOFVVURJTDtLddj7w

- මෙම අංශයන් වෘත්තීය සමිතිකරණය නොවූ හෝ, **පුරුෂාධිපත්‍ය අවකාශය** සහිත වෘත්තීය සමිති වේ. එසේම බොහෝ දුරට මෙම වෘත්තීය සමිති පිරිමින් විසින් ආධිපත්‍යය දරයි. අනෙක් අතට වැටුප් මණ්ඩලය සහ ජාතික කම්කරු උපදේශක සභාව (NLAC) වැනි රාජ්‍ය ආයතනවල තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ස්ත්‍රීන් නොමැත. මෙම පරතරය පියවා ගැනීමට සහ කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීමට ස්ත්‍රී නායකත්වයෙන් යුත් වෘත්තීය සමිති විශාල උත්සාහයක් දරන අතර, ඔවුන් තවමත් විශාල අභියෝගවලට මුහුණ දෙයි.

- ශ්‍රී ලංකාවේ **විදේශ මුදල් ඉපැයීම්** අවිවාදිත ලෙස 'ස්ත්‍රීකරණය' වුව ද, කර්මාන්තයේ ලාභය සහ විදේශ රැකියාවල භයානක තත්ත්වයන් නොතකා රැකියා කරන මෙම අංශවල ස්ත්‍රීන්ගේ වැටුප් අඩු මට්ටමක පවතී. එපමණක් නොව, ඇඟලුම් අංශයේ ස්ත්‍රීන් විසින් COVID 19 වසංගතය සහ අපනයන භාණ්ඩ මත තීරුබදු පැනවීම (tariffs) මගින් ආර්ථිකයට ඇති වූ ගෝලීය හා දේශීය බලපෑමේ බර දරනු ලබයි. COVID අතරතුර රටේ බොහෝ ස්ථාන වසා දැමූ අතර, කර්මාන්තශාලා 'අත්‍යවශ්‍ය සේවා' ලෙස සලකුණු කර කර්මාන්තශාලා කටයුතු දිගටම පවත්වා ගෙන යන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් අතර COVID 19 ව්‍යාප්ත වී රෝගීන් විශාල වශයෙන් පොකුරු ඇති විය. එහෙත් එම කර්මාන්ත ස්ත්‍රී ශ්‍රමයෙන් ලාභ උපයා ගන්නා ලදී.

- තේ වැනි ප්‍රධාන අපනයන කෘෂිකාර්මික නිෂ්පාදනවල **සේවකයින්ගෙන්** විශාල ප්‍රතිශතයක් ස්ත්‍රීන් වේ. කම්කරුවන් සඳහා වැටුප් සහ ප්‍රමිතීන් නියම කරන සාමූහික ගිවිසුම් බොහෝ කලකට පෙර අහෝසි වී ඇත. මෙම වතුකරයේ සේවය කරන මලයහ දමිළ ස්ත්‍රීන් ද ප්‍රමාණවත් ආරක්ෂක උපකරණ නොමැතිව වැඩ කරන අතර අනාරක්ෂිත නිවාසවල ජීවත් වෙයි. මෙම ගැටළු නිසා, ඔවුන්ට යහපත් රැකියාවක් හෝ වඩා හොඳ ජීවන තත්වයන්ට ප්‍රවේශ විය නොහැකි අතර, එමගින් දැනටමත් අවදානමට ලක්ව ඇති ප්‍රජාවගේ ජීවිතය දුෂ්කර වේ.


- ශ්‍රී ලංකාවේ විශාලතම විදේශ විනිමය මූලාශ්‍රය වන්නේ විදේශ සෘජු ආයෝජන හෝ අපනයන ආදායම් නොව, ගෘහ සේවයෙන් ලැබෙන විදේශ ප්‍රේෂණ යි. එහෙත්, විදේශයන්හි සිටින ස්ත්‍රී සේවිකාවන්ට රෝගී තත්වයකදී විරැකියාවට මුහුණ දීමේදී හෝ මහලු වියේදී සමාජ ආරක්ෂාවක් නොමැත. ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වලට යහපත් ප්‍රතිඵල සහතික කිරීම වෙනුවට සූරාකෑම නොතකා සේවකයින් අපනයනය කිරීමට වැඩි කැමැත්තක් දක්වයි.

- **ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය** වැඩි කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික දුෂ්කරතා සඳහා විසඳුමක් නොවන අතර ම එය ස්ත්‍රී සවිබල ගැන්වීමට පිළිතුරක් ද නොවේ. ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ ඔවුන්ගේ දේශීය සහකරුවන්ට අවශ්‍ය වන්නේ සතියේ සෑම දිනකම දිවා රෑ නොබලා කරන වැටුප් රහිත වැඩවලට අමතරව ස්ත්‍රීන් වැටුප් සහිත වැඩ භාර ගැනීමයි. ශ්‍රී ලංකාවේ පිරිමින්ගෙන් 5% ට සාපේක්ෂව ස්ත්‍රීන්ගෙන් 57.2% කට වඩා වැඩි පිරිසක් ගෙදර දොරේ වැඩවල නිරත වෙයි[8]. ස්ත්‍රීන්ගේ වැටුප් රහිත සුරැකුම් වැඩ හඳුනා ගැනීමට, අඩු කිරීමට සහ නැවත බෙදා හැරීමට සම්බන්ධයෙන් කිසිවක් පවසා හෝ කිසිවක් සිදුකර නොමැත.

8 Sri Lanka Labour Force Survey Annual Report - 2023. Department of Census and Statistics & Ministry of Finance, Economic Stabilization and National Policies. In https://www.statistics.gov.lk/.

ස්ත්‍රීන් දැනටමත් මූල්‍ය උත්පාදන ආර්ථිකයේ වැඩ කරමින් සිටියි. නමුත් එය පැහැදිලිව නොපෙනෙන්නේ එයින් වැඩි ප්‍රමාණයක් අවිධිමත් බැවිනි. ස්ත්‍රීන් අඩු වැටුප් සහිත ගෘහ ශ්‍රමයේ වැඩි වශයෙන් නියැලෙයි; ලුණු ලේවායන්, කන්න අනුව වතුවල වැඩ කිරීම සහ කුඩා පරිමාණයේ ආහාර සම්බන්ධ සේවාවල අනියම් දෛනික වැටුප් සහිත වැඩවල ද සේවය කරයි. එසේම ඔවුන් නිවසේ සිට දුරස්ථ වෙළෙඳපොළ සඳහා වැඩ කරමින්, විකිණීම සඳහා කෙටි ආහාර ද්‍රව්‍ය සකස් කිරීම, පහන් තිර සෑදීම, කාඩ්බෝඩ් පෙට්ටි සකස් කිරීම, ගඩොල් සඳහා මැටි සෑදීම සහ තවත් බොහෝ දේ කරයි. මෙහිදී ස්ත්‍රීන් නිවස තුළ හෝ පිටත, අවිධිමත් හෝ විධිමත්, ලෙස වැඩ කරන අතර මෙහි පොදු ලක්ෂණය නම් පිරිමින්ට වඩා ස්ත්‍රීන්ට අඩු වැටුපක් ලබා දීමයි.

ගේදොර වැඩ




ස්ත්‍රීන් සිදු කරන **වැටුප් රහිත සුරැකුම් වැඩවලට** වටිනාකමක් ලබා දීම පිළිබඳව ජාතික ජන බලවේගය සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සහ කතාවලදී ඍජුවම සඳහන් කර ඇත. මෙහිදී 'වැඩ' යන්නෙහි අර්ථකථනය පුළුල් කිරීම ඉතා වැදගත් ය. එනම්, නිවසේ හා ප්‍රජා කටයුතු තුළ ස්ත්‍රීන් නොමිලේ කරන දේවල් ද වැඩක් ලෙස පිළිගැනීම, සහ ඒ අනුව රජයේ ප්‍රතිපත්ති සැලසුම් කිරීම ඇතුළත් වේ. එසේ නොකළහොත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවයන් මුල් බැස ගනු ඇත, නැතහොත් තවදුරටත් නරක අතට හැරෙනු ඇත.

- ස්ත්‍රීන් ඇතුළු සියලුම සේවකයින් සඳහා ජීවන වැටුපක්, ආරක්ෂිත සේවා කොන්දේසි සහ ගෞරවය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා, **සංවිධානය වීමේ අයිතිය සහ සාමූහික කේවල් කිරීමේ අයිතියට** ගරු **කිරීම** සහතික කිරීම.
- සංක්‍රමණික සේවකයින්ට සහ ඔවුන්ගේ **සමිතිවලට SLBFE හි වගවීම** සහතික කිරීම සහ නියෝජිතයන් සහ තැරැව්කරුවන් වෙනුවට රජයෙන්-රජයට ද්විපාර්ශ්වික ගිවිසුම් හරහා ආරක්ෂිත සහ අයිතිවාසිකම් මත පදනම් වූ ශ්‍රම සංක්‍රමණයට පහසුකම් සැලසීම.

- ගෘහ ශ්‍රමයේ අවිධිමත්භාවය සාකච්ඡා කෙරෙන ILO හි 189 වන සම්මුතිය අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- සියලුම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට/ලිංග භේදවලට අයත් සේවකයින් සඳහා ‘ආරක්ෂිත සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර නිදහස් වැඩ ලෝකයක්’ සහතික කිරීමට රජය බැඳී සිටින C190 ILO සම්මුතිය අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයෙන් ප්‍රමාණවත්, ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි සුරැකුම් සේවා මෙන්ම පීතෘ නිවාඩු විධිවිධාන ඇති කිරීම.

# සත්‍යය, යුක්තිය සහ හානිපූරණය

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසන් වී වසර 15කට වැඩි කාලයක් ගතවී ඇතත්, සියලු ජනවාර්ගික හා ආගමික කණ්ඩායම්වලට ගෞරවයෙන් හා සමානාත්මතාවයෙන් යුතුව ජීවත් විය හැකි අර්ථවත් සාමයක් තවමත් දක්නට නැත. සිවිල් යුද්ධයේ වින්දිතයින් තවමත් යුද්ධයට සම්බන්ධ කුරිරුකම් සඳහා සත්‍යය සහ යුක්තිය සොයමින් සිටින අතර, ඔවුන්ගෙන් බහුතරයක් බලහත්කාරයෙන් අතුරුදහන් කරනු ලැබූවන්ගේ මව්වරුන්, භාර්යාවන්, සහෝදර සහෝදරියන් සහ දරුවන් ය. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ 2012 වාර්තාවේ අභ්‍යන්තර සමාලෝචන කමිටුව විශ්වාසදායක මූලාශ්‍ර උපුටා දක්වමින් ඇස්තමේන්තු කර ඇත්තේ, යුද්ධය අතරතුර අතුරුදහන් වූ සිවිල් වැසියන් 70,000 කට වැඩි සංඛ්‍යාවකි[9]. වගවන ලෙස ඉල්ලා අරගලයේ පෙරමුණ ගෙන සිටින අතුරුදහන් වූවන්ගේ පවුල්වල දෙමළ ස්ත්‍රී සාමාජිකයින්, නොබියව රාජ්‍යයෙන් ප්‍රශ්න කිරීම හේතුවෙන් අනුප්‍රාප්තික රජයන් විසින් එම ස්ත්‍රීන් විවිධ ආකාරයෙන් නිරීක්ෂණයට, බිය ගැන්වීමට සහ අපරාධකරණයට ලක් කර ඇත. පශ්චාත් යුද සමයේ අනුප්‍රාප්තික ආණ්ඩු, විපතට පත් අයගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කර හෝ ප්‍රතිචාර දැක්වීමට අසමත් වී ඇති ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් විසින් සිදු කරන ලද අපයෝජනයන් පිළිබඳ විශ්වාසනීය පරීක්ෂණයක් සිවිල් සමාජය ඉල්ලා සිටියි.

අතුරුදහන් කරනු ලැබූවන්



70,000

ජාතික ජන බලවේගය, අතීතයේ සිදු වූ දේශපාලන ඝාතන සිද්ධීන්, අතුරුදහන් කිරීම් සහ පහරදීම් සම්බන්ධයෙන් විමර්ශනය කර යුක්තිය ඉටු කිරීමට පොරොන්දු වී තිබේ. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය (OMP), වන්දි ගෙවීමේ කාර්යාලය සහ ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය (ONUR) වැනි **‘දේශීය යාන්ත්‍රණ’**

9 Source: Report of the Secretary-General’s Internal Review Panel on United Nations Action in Sri Lanka, November 2012, page 14 <https://digitallibrary.un.org/record/737299?ln=en&v=pdf>

හරහා 'ජාතික සමගිය සහ සංහිඳියාව' උදෙසා පියවර ගන්නා බවට ප්‍රකාශ කර ඇත. කෙසේ වෙතත්, සත්‍යය සහ යුක්තිය ලබා දීමට ඔවුන් නිරන්තරයෙන් අසමත් වීම නිසා උතුරු නැගෙනහිර බොහෝ ප්‍රජාවන්ට දේශීය යාන්ත්‍රණයන් ගැන කිසිදු බලාපොරොත්තුවක් නොමැත.

- **යුක්තිය සඳහා දේශීය යාන්ත්‍රණයක්** ස්ථාපිත කිරීමට පෙර, වින්දිත-දිවි ගලවා ගත් ප්‍රජාවන් සමඟ විශ්වාසය ගොඩනැගීමේ ගැඹුරු සහ අර්ථවත් ක්‍රියාවලියක් රජය විසින් සිදු කළ යුතුය. සොල්දාදුවන් ජාතික වීරයින් ලෙස සලකන සිංහල බෞද්ධ ජනවාර්ගික-ජාතිකවාදී දෘෂ්ටියට අභියෝග කිරීම, සත්‍යය සහ යුක්තිය ආමන්ත්‍රණය කිරීමට රජයේ කැපවීම සහ දේශපාලන කැමැත්ත දැඩි ලෙස තහවුරු කිරීම, යුද්ධයට සම්බන්ධ අපරාධ සඳහා වගවීමේ අවශ්‍යතාවය පිළිබඳ ජාතික අවබෝධය ඉහළ නැංවීම සහ මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් ප්‍රජාවන් අතර අර්ථවත් හුවමාරුවකට පහසුකම් සැලසීම ද අවශ්‍ය වනු ඇත. වගවීම ඉල්ලා සිටින පාර්ශවයන් මෙම ගැඹුරු පද්ධතිමය වෙනසක් සඳහා සටන් කිරීම තීරණාත්මක වන අතරම, මෙම ගැටලු සඳහා ජාත්‍යන්තර ක්‍රියාකාරීන්ගේ මැදිහත්වීම හඳුනා ගැනීම ද ඉතා වැදගත් වේ.

- පශ්චාත් යුද සමය තුළ **ඉඩම් සහ ඉඩම් ගැටුම්** පිළිබඳ ගැටලුව තවමත් විසඳී නොමැත. බොහෝ දෙමළ ප්‍රජාවන් ඔවුන්ගේ සාම්ප්‍රදායික නිජබිම්වලින් අවතැන් වී සිටින අතර, ඒවා හමුදාව විසින් අත්පත් කරගෙන ඔවුන්ට ප්‍රතිලාභ ලැබෙන වගා කටයුතු හෝ සංචාරක කටයුතු සඳහා භාවිතා කරනු ලැබේ. රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශවල අය උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉඩම් අත්පත් කර ගැනීමෙන් සහ ඉඩම් අල්ලා ගැනීමෙන් නව ඉඩම් ගැටුම් ද ඇති කරයි. ඔවුන් සාමාන්‍ය ජනතාවගේ ඉඩම් භාවිතය සහ ප්‍රවේශය සඳහා සීමාවන් පනවා ඇත. එසේම සාම්ප්‍රදායිකව දෙමළ සහ මුස්ලිම් ජනාකීර්ණ ප්‍රදේශවල ඉඩම් 'පූජනීය ප්‍රදේශ' හෝ 'බෞද්ධ ස්ථාන' ලෙස නම් කිරීමට, එම ප්‍රදේශවලින් ජනතාව මුලිනුපුටා දැමීමට, හිමිකම් පෑමට සහ එම ප්‍රදේශවල නම් වෙනස් කිරීමට බෞද්ධ පූජක පක්ෂය දරන උත්සාහයන් මෙයට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියට සහාය වීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

- ජාත්‍යන්තර අධීක්ෂණයක් සහිතව **සත්‍යය සහ යුක්තිය සඳහා අර්ථවත් සහ බලාත්මක කළ හැකි දේශීය යාන්ත්‍රණයක්** ස්ථාපිත කිරීම. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම (LLRC), අතුරුදහන් වූවන්ගේ පැමිණිලි පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසම (PCICMP) සහ ප්‍රතිසන්ධාන යාන්ත්‍රණ පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකාය (CTF) වැනි ආයතනවල **අතීත මුලපිරීම්වල සොයාගැනීම්** මෙහිදී සැලකිල්ලට ගත යුතුය.
- බලහත්කාරයෙන් අතුරුදහන් කරනු ලැබූවන්ගේ පවුල්වල සත්‍යය සඳහා වන ඉල්ලීම විසඳීමට OMP සතු ව්‍යවස්ථාදායක කාර්යභාරය ඉටු කිරීම.
- දිවයින පුරා ඇති සියලුම රැඳවුම් මධ්‍යස්ථානවල සිටින **සියලුම රැඳවියන්ගේ නම් සහ හමුදා සේවා පහසුකම්** මොනවාදැයි (**military facilities**) යන තොරතුරු නිකුත්කිරීම.

- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHRC) සහ එහි **ශ්‍රී ලංකා වගවීමේ** ව්‍යාපෘතිය (OHCHR) සමග සහයෝග යෙන් කටයුතු කිරීම.

- **ජාත්‍යන්තර** මානව **හිමිකම්** සහ **මානුෂීය නීතිය** බරපතල ලෙස උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කිරීම. **මැයි 18 ජාතික ශෝක දිනයක් ලෙස පිළිගෙන දෙමළ පවුල්වලට මූලික**

- **අයිතියක් ලෙස අනුස්මරණය කිරීමේ අයිතිය** ආරක්ෂා කිරීම.

- **දිගුකාලීන ඉඩම් ආරවුල් විමර්ශනය** කිරීම, තීන්දු දීම සහ විසඳුම් ලබාදීම සඳහා පළාත් ඉඩම් කොමිෂන් සභා සක්‍රීය කිරීම.

# නීති ප්‍රතිසංස්කරණ

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සියලුම පුරවැසියන්ට මූලික අයිතිවාසිකම් සහ වෙනස්කොට නොසැලකීම සහතික කර ඇත. එහෙත් ස්ත්‍රීන්ට සහ LGBTQI පුද්ගලයින්ට පැහැදිලිවම වෙනස්කොට සලකන නීති ගණනාවක් තිබේ.

**1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (MMDA)** මගින් මුස්ලිම් ස්ත්‍රීන් සහ ගැහැණු ළමයින්ගේ ඇතැම් මූලික මානව අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කරයි. එහි විවාහ වීමට අවම වයසක් නොමැති බැවින් ළමා විවාහය නීත්‍යානුකූල වේ. මෙයින් අදහස් වන්නේ මුස්ලිම් දරුවන් ඔවුන්ගේ අනෙකුත් ආගම්වල සම වයසේ මිතුරන් මෙන් නීතියෙන් ආරක්ෂා නොවන බවයි. තවද මනාලිය ඇගේ විවාහ ලියාපදිංචි කිරීමේ පෝරමයට අත්සන් නොකරන අතර එමගින් විවාහයට ඇති ඇයගේ නිදහස සහ කැමැත්ත පිළිබඳ ප්‍රශ්නය මතුවේ. මුස්ලිම් පිරිමින්ට බහු විවාහය සහ දික්කසාදය සඳහා කොන්දේසි විරහිතව අයිතියක් ඇත. එපමණක් නොව ක්වාසි (කාති) උසාවිවල මුස්ලිම් පුද්ගලික නීතිය විනිශ්චය කරන ක්වාසිවරුන් සියල්ලන් පිරිමින්ය.

දිවයින පුරා මුස්ලිම් ස්ත්‍රී කණ්ඩායම් වසර 40 කට[10] වැඩි කාලයක් තිස්සේ MMDA ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිට ඇත. 1956 සිට රජය විසින් පත් කරන ලද කමිටු කිහිපයක් විසින්ම අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ යෝජනා කර ඇත. NPP විසින් MMDA ප්‍රතිසංස්කරණය කිරීමට පොරොන්දු වූ නමුත් දැන් එය ප්‍රතික්ෂේප කර ඇත.[11] රජය ගතානුගතිකයින්ට සහ ස්ත්‍රී විරෝධීන්ට අවස්ථා දීම වෙනුවට මුස්ලිම් ස්ත්‍රීන්ගේ ඇති සමානාත්මතාවය සහ යුක්තිය සඳහා ඇති අයිතිය වෙනුවෙන් පෙනී සිටිය යුතුය.

10 MPLRAG. (2023, July 31). MPLRAG demands for MMDA reforms - Muslim Personal Law Reform Action Group (MPLRAG). https://www.mmdasrilanka.org/demands/

11 MPLRAG. (2024, November 7). STATEMENT: Minister Vijitha Herath's comments that MMDA reforms are not on the agenda fails to recognize long standing demands for change. - MPLRAG. Muslim Personal Law Reform Action Group (MPLRAG). https://www.mmdasrilanka.org/statement-minister-vijitha-heraths-comments-that-mmda-reforms-are-not-on-the-agenda-fails-to-recognize-long-standing-demands-for-change/

# “365 සහ 365අ වගන්ති අහෝසි කිරීම” සහ

# “1951 MMDA ප්‍රතිසංස්කරණය”

- යටත් විජිත නීති සම්පාදනයේ තවත් අවශේෂයක් වන දණ්ඩ නීති සංග්‍රහයේ **365 සහ 365(අ) වගන්ති**, සමරිසි වැඩිහිටියන් අතර එකඟතාවයෙන් සිදුවන ලිංගික ක්‍රියාවන් අපරාධයක් ලෙස සලකයි. 2023 දී, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ, විශේෂයෙන් වැඩිහිටියන් අතර පෞද්ගලික, එකඟතාවයෙන් සිදුවන ලිංගික සම්බන්ධතා, මානව ගරුත්වය සහ වෙනස් කොට නොසැලකීමේ මූලධර්ම-වලට අනුකූල වන අතර එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය නොකරන බවයි. කෙසේ වෙතත්, මෙම විධිවිධානවලට අනුකූලව පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සහ අයුතු ලෙස සැලකීම මෙන්ම LGBTQ+ ප්‍රජාවේ සාමාජිකයින්ට ඉලක්ක කරගත් ප්‍රහාර දිගින් දිගටම පවතී.[12] පුද්ගලයින් බොහෝ විට පොලිස් ස්ථානවලට ගෙන යන අතර ඔවුන්ගේ ලිංගික සහ/හෝ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය මත පදනම්ව නිලධාරීන් විසින් ඔවුන් නින්දාවට හා අපයෝජනයට ලක් කරනු ලැබේ.

- පාදඩ ආඥා පනත (**The Vagrants Ordinance**) යනු යටත් විජිත යුගයේ නෂ්ටාවශේෂයකි. එය අවලංගු කිරීමට කාලය පැමිණ ඇත. මෙම ආඥා පනත මූලික වශයෙන් සමාජයේ ආන්තික සහ අවාසි සහගත කණ්ඩායම්වල පුද්ගලයින්ට පීඩාකාරී ආකාරයකින් ක්‍රියාත්මක වන සදාචාරාත්මක හෝ විනීතභාවය පිළිබඳ නීතියකි. . ලිංගික ශ්‍රමිකයින්, විශේෂයෙන් සංක්‍රාන්ති ස්ත්‍රීන් බිය ගැන්වීමට, හිරිහැර කිරීමට සහ සිරගත කිරීමට පොලිසිය විසින් මෙම ආඥා පනත භාවිතා කර ඇත.

- නීති කොමිසමේ 2012 නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් ගබ්සාව පිළිබඳ විෂය ආමන්ත්‍රණය කිරීමට NPP ප්‍රතිපත්ති ප්‍රකාශනය පොරොන්දු වී ඇත. මෙම නිර්දේශ මගින් ආරක්ෂිතව **ගබ්සා කිරීම්** සඳහා අවසරය ලබා දෙන්නේ අවස්ථා දෙකකදී පමණි. එනම් ස්ත්‍රී දූෂණයකින් ගැබ් ගැනීමක් සිදුවුවහොත්, සහ කළලයට බරපතළ ආබාධයක් තිබේ නම් පමණි. නමුත් ශ්‍රී ලංකාවේ ගබ්සාවන් සිදු කිරීමට බොහෝ ස්ත්‍රීන් යොමු වන්නේ මෙම කාරණා දෙකටම එහාගිය වෙනත් හේතු නිසා ය.

---

12 Joshi, Y. (2023). “All five fingers are not the same.” Human Rights Watch. https://www.hrw.org/report/2016/08/16/all-five-fingers-are-not-same/discrimination-grounds-gender-identity-and-sexual

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පෙර පනවන ලද වෙනස්කොට සැලකීමේ නීති ප්‍රතිසංස්කරණය කිරීමට හැකිවන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16-1 **වගන්තිය අවලංගු කිරීම.**
- MMDA හි **ස්ත්‍රී පුරුෂභාවය මත වෙනස් කොට සැලකීමේ විධිවිධාන** ප්‍රතිසංස්කරණය කිරීම.
- දණ්ඩ නීති සංග්‍රහයේ **365 සහ 365අ වගන්ති ඉවත් කිරීම.**
- **පාදඩ ආඥා පනත ඉවත් කිරීම.**
- ගබ්සාවට අවසර දී ඇති නියමයන් සහ අවස්ථා පිළිබඳ පුළුල් උපදේශනයකින් පසුව, **ගබ්සාව යන්න සාපරාධී වරදෙන් ඉවත් කිරීම.**
- 2024 ස්ත්‍රී සවිබලගැන්වීමේ පනත සම්මත වී ඇති අතර කාන්තා කොමිසමක් කඩිනමින් වැඩ කිරීමට පටන් ගන්නා බැවින්, **කාන්තා කටයුතු අමාත්‍යාංශය සහ කාන්තා කාර්යාංශය රජයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය යාන්ත්‍රණය පිළිබඳ සමාලෝචනය කිරීම.** මෙම සමාලෝචනයේදී ඒවායේ භූමිකාවන්, අරමුදල් සැපයීම, සම්පත් සහ හැකියාවන් දෙස බැලිය යුතුය.

## පාරිසරික යුක්තිය

ශතවර්ෂ ගණනාවක් පුරා යටත් විජිතවාදය, අධිරාජ්‍යවාදය, සූරාකෑම, සහ අසමානතාවය හේතුවෙන් පැන නගින දේශගුණික අර්බුදයකට ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටියි. අධික උෂ්ණත්වය, සංකීර්ණ ජල පද්ධති සහ දරුණු දේශගුණික තත්ත්වයන්ට නිරාවරණය වීම හේතුවෙන් දිවයින නරක අතට හැරෙන දේශගුණික විපර්යාසයන්ට බෙහෙවින් ගොදුරු වේ. මෙය කෘෂිකර්මාන්තයට සහ ජල සම්පත් මූලික කර ගත් අංශවලට, වෙරළබඩ කලාපවලට මෙන්ම මානව සෞඛ්‍යයට ද සැලකිය යුතු අවදානම් ඇති කරයි.

### "ජීවත්වීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන්න"

අනුප්‍රාප්තික රජයන් විසින් මසුන් ඇල්ලීම සහ වගාව ජනප්‍රිය ආදායම් මාර්ග වන පහත් බිම් දූපත් වැනි පාරිසරික වශයෙන් සංවේදී කලාපවල මහා පරිමාණ **පතල් හා විදුලිබල ව්‍යාපෘති** සැලසුම් කර ඇත. මෙම ප්‍රදේශවලින් සමහර ජනතාව යුද්ධයෙන් අවතැන් වී ඇති අතර, ඔවුන් සමඟ එම අසාධාරණයේ ඉතිහාසය බර දරයි.

- අර්බුදයට ප්‍රතිචාර දැක්වීම සඳහා දැන් පුළුල් ලෙස යොදා ගන්නා ක්‍රමවේදයන්, පරිසරයට ඇති කරන විෂ සහිත බලපෑම්වලට වගකිව යුත්තන්ගේ වගවීමට සහතික කිරීමට අපොහොසත් වේ. **කාබන් ණය** (Carbon credit) මගින් ස්වභාවධර්මය වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කරන අතර එයින් වර්තමානයේ සිදුවන පරිසර දූෂණය හා පාරිසරික හායනය නතර නොවෙයි. මේවා දේශගුණික ක්‍රියාමාර්ග ලෙස වෙස්වළාගත් විරූපණයක් ක්‍රියා කරයි - ග්‍රීන් වොෂින් (greenwashing) මීට නිදසුනකි.

- නරක අතට හැරෙන පාරිසරික අර්බුදවල බර දරා සිටින්නේ සහ, බර දරාගනු ඇත්තේ ඉතාමත් අවාසි සහගත ප්‍රජාවන් ය. විශේෂයෙන් ඔවුන්ගේ ජීවනෝපායන් සම්බන්ධයෙන් ස්ත්‍රීන් ප්‍රධාන වශයෙන් අවදානමට ලක් වේ. දුර්වල අස්වැන්න හේතුවෙන් ස්ත්‍රීන්ගේ සුරැකුම් වැඩ කටයුතු සහ ආහාර නිෂ්පාදනයේදී නිෂ්පාදනය යන කරුණුවලදී වැඩි පීඩනයකට මුහුණ දෙන අතර, බෝග විනාශය සහ ආර්ථික අර්බුද හේතුවෙන් ඉහළ අනුපාතයක ප්‍රචණ්ඩත්වයක් සහ දරිද්‍රතාවයක් අත්විඳිය හැකිය. විකල්ප ආදායම් මාර්ග සොයන ස්ත්‍රීන්ගේ සංක්‍රමණය කෙරෙහි ද **දේශගුණික විපර්යාස** සැලකිය යුතු දැඩි බලපෑමක් ඇති කර තිබේ. මෙම සංක්‍රමණය රට තුළ නාගරික සේවා සහ නිෂ්පාදන ආර්ථිකය දෙසට හෝ ගෘහ සේවය සඳහා රටින් පිටතට ද විය හැකිය.

- NPP ප්‍රතිපත්ති ප්‍රකාශනයේ **පරිසරය** පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන අතර, එහි ආරක්ෂාව සහ විසඳුම් සෙවීම සඳහා ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම ද ඇතුළත් වේ. එය පෘථිවියේ එකම හිමිකරු ලෙස මිනිසා තබන මානව කේන්ද්‍රීය චින්තනයෙන් ඉවත් වීමට ද අපේක්ෂා කරයි. තවද, එහි Clean Sri Lanka ව්‍යාපෘතිය වෙනස, ඒකාබද්ධතාවය සහ සහයෝගීතාවය හඳුන්වා දීම තුළින් පාරිසරික, සමාජීය සහ පාලන මුලපිරීම්වල ජාතික උත්සාහයන් නැවත ස්ථානගත කිරීමට උත්සාහ කරයි. මෙම ප්‍රතිපත්තිමය ඉලක්කවලට අනුකූලව, අපි රජයෙන් ඉල්ලා සිටින්නේ,

- ජීවත්වීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතියක් ලෙස ආරක්ෂා කිරීම.
- පිරිසිදු වාතය, ජලය සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහතික කරන සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සඳහා අයිතිය පිළිබඳ නීතියක් පැනවීම.
- සංවර්ධන ව්‍යාපෘති මගින් ප්‍රජාවන්ට හානි සිදුවුවහොත්, ඔවුන්ට සාධාරණ වන්දි ලබා ගත යුතුය. එසේම සියලුම සංවර්ධන ව්‍යාපෘති සඳහා අනිවාර්ය සහ අර්ථවත් පාරිසරික තක්සේරු කිරීම් සහ දැනුවත් ප්‍රජා උපදේශන තිබිය යුතුය.
- පාරිසරික හානිය සිදු කරන ආයතන සහ දූෂකයින්ට දඩුවම්, දඩ මුදල් පමුණුවා එමගින් ලබන අරමුදල් බලපෑමට ලක් වූ ප්‍රාදේශීය ප්‍රජාවන්ට ආපසු ලබා දීමට වගබලා ගැනීම.

# ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

ස්ත්‍රීන් පොදු ක්ෂේත්‍රය තුළ සහ පවුලේ පෞද්ගලික ක්ෂේත්‍රය තුළ ඉහළ මට්ටමේ ප්‍රචණ්ඩත්වයකට මුහුණ දෙයි. ස්ත්‍රීන් තම ජීවිත කාලය තුළ වෙනත් ඕනෑම අයෙකුගෙන් සිදුවන ශාරීරික හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට වඩා දෙගුණයකින් තම සහකරුවෙකුගෙන් ශාරීරික හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය අත්විඳීමට ඇති ඉඩකඩ වැඩිය.[13] පොලිස් කාන්තා හා ළමා කාර්යාංශවලට ස්ත්‍රී දූෂණ පැමිණිලි දහස් ගණනක් සෑම වසරකම ලැබේ; නමුත් වාර්ෂිකව එයින් වරදකරුවන් වූ ගණන සිව්දෙනෙකුට වඩා නොමැත. රැකියා ස්ථානයේ සහ පොදු ප්‍රවාහනයේදී ද ස්ත්‍රීන් ඉහළ මට්ටමේ ලිංගික හිංසනයන්ට මුහුණ දෙයි. එපමණක් නොව, සමාජ මාධ්‍ය සහ ඩිජිටල් තාක්ෂණයන්හි වර්ධනයත් සමග ස්ත්‍රීන් සහ ගැහැණු ළමයින් දැන් නව ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු වේ.

- වසර 20කට පෙර, ශ්‍රී ලංකාව **ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන්** ස්ත්‍රීන් ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය කරන ලදී. කෙසේ වෙතත්, අපරාධ නීතිය ස්ත්‍රීන්ගේ ආරක්ෂාවට වඩා පවුල් ඒකකය ආරක්ෂා කිරීමට ප්‍රමුඛත්වය දෙන පීතෘ මූලික දෘෂ්ටිවාදය සහ නිවස තුළ ප්‍රචණ්ඩත්වය පිළිගැනීමට නීතිය ක්‍රියාත්මක කරන්නන් දක්වන කැමැත්ත හේතුවෙන් මෙම නීතියේ පිහිට ඉල්ලා සිටින ස්ත්‍රීන් සංඛ්‍යාව සීමා වී ඇත.

- නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ප්‍රචණ්ඩත්වය සුළු කොට සැලකීම, නීති යටතේ ඇති ආරක්ෂාවන් පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම සහ බොහෝ වින්දිතයින් විසින් ප්‍රචණ්ඩත්වය පිළිගනිමින් පවුලේ සහ සමාජයේ අසමාන ස්ත්‍රී පුරුෂ-බල සබඳතා තවදුරටත් ශක්තිමත් කරමින් එවැනි ප්‍රචණ්ඩත්වයන් සඳහා දණ්ඩ මුක්තිය පවත්වාගෙන යාම සහ තහවුරු කිරීම සිදු කරයි. කෙසේ වෙතත්, අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීම සහ කාසරල් ක්‍රමය (carceral system) බොහෝ දුප්පත් පුද්ගලයින් ඉලක්ක කර ගැනීම සිදු කරන බව අපි මෙහිදී හඳුනා ගනිමු.

- සුරක්ෂා නිවාස/නවාතැන්, නීති ආධාර සහ උපදේශනය වැනි ප්‍රමාණවත් ආධාරක සේවාවන් නොමැතිකම නිසා විපතට පත් අය තවදුරටත් බල රහිත කර ඇත. එවැනි බොහෝ වැඩසටහන් රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙහෙයවනු ලැබේ. නමුත් ආර්ථික අර්බුදය ඇති වූ අවස්ථාවේදී, රජයේ සහාය ලබන **සමහර පහසුකම්** පළමුවෙන්ම වසා දමන ලදී.

- ප්‍රචණ්ඩත්වයට ලක්වූවන් සඳහා සමාජ ආරක්ෂාව සහ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතිවාසිකම් (SRHR) පිළිබඳ අධ්‍යාපනය සඳහා කැපවීම ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අසමානතාවය පිළිබඳ ගැටලුව හඡඡ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගැඹුරින් ආමන්ත්‍රණය කරයි. මෙම පොරොන්දු සම්පූර්ණයෙන් ඉටු කිරීම අත්‍යවශ්‍ය වේ. ඉහත සාකච්ඡා කළ පරිදි මෙම **සම්මත වෙනස්කම්**, ස්ත්‍රීන්ගේ ජීවිත සහ සමාජ අන්තර්ක්‍රියා කෙරෙහි කල් පවතින බලපෑමක් සඳහා අත්‍යවශ්‍ය වේ.

13 Women's Wellbeing Survey - 2019. Department of Census and Statistics. https://srilanka.unfpa.org/en/publications/womens-wellbeing-survey-2019

- 2016 ස්ත්‍රීන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කොමිසමේ විපක්ෂ නායකවරයාගේ වාර්තාව ක්‍රියාත්මක කිරීම සඳහා **කාර්ය සාධක බලකායේ නිර්දේශ ක්‍රියාත්මක** කිරීම.

- ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් ගොදුරු වූ අය සඳහා **නීති ආධාර කොමිසම හරහා නොමිලේ සේවා පහසුකම් සැලසීම.**

- නවාතැන් සේවා (සුරක්ෂා නිවාස/ නවාතැන්) සඳහා ජාතික අයවැයෙන් කළ හැකි සහායන් සඳහා මුදල් වෙන් කිරීම.තාක්ෂණය හේතුවෙන් සිදුවන ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ඇතුළුව දේශපාලනයේ ස්ත්‍රීන්ට එරෙහිව සිදු වන සියලු ආකාරයේ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, බිය ගැන්වීම් සහ වෛරී ප්‍රකාශ වැළැක්වීම, විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ දඬුවම් පමුණුවීම.

- පැමිණිලි කෙරෙහි ක්‍රියාත්මක වීම සහ සුදුසු සේවා සැපයුම්කරුවන් වෙත ඒවා යොමු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව පෝරමයන් ශක්තිමත් කිරීම.

- සම්ප්‍රදායික ලිංගික ප්‍රතිමානයන් හා ලිංගික භූමිකා අභියෝගයට ලක් කිරීමට, ඒවා වෙනස් කිරීමට (වෙනස් කළ හැකි) සංස්කෘතික, කලා, අධ්‍යාපනය සහ විනෝදාස්වාදය වැනි දේ භාවිතා කිරීම.

ROSA LUXEMBURG STIFTUNG SOUTH ASIA

ජර්මානු ෆෙඩරල් සමූහාණ්ඩුවෙහි ආර්ථික සහයෝගිතා සහ සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශයෙන් ලද අරමුදල් සමග, රෝසා ලක්සම්බර්ග් ස්ටිෆ්ටුන්ග් මගින් මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය සහ ඊට ආධාර වූ පර්යේෂණයන්ට අනුග්‍රහය දක්වන ලදී.

මූලාශ්‍රය සහ මුල් ප්‍රකාශකයා පිළිබඳ නිසි යොමු යොදාගන්නා තාක් කල්, මෙම ප්‍රකාශනය හෝ එහි කොටස් ඕනෑම පුද්ගලයෙකුට නොමිලේ භාවිත කළ හැකිය.
මෙම ප්‍රකාශනයෙහි අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම *SSA* දරන අතර, මෙහි අඩංගු දෑ RLS හි මතිමතාන්තර පිළිබිඹු නොකරයි.

SSA SOCIAL SCIENTISTS' ASSOCIATION

සමාජ විද්‍යාඥයින්ගේ සංගමය
380/86, සරණ පාර, කොළඹ 07.
Web: https://ssalanka.org/
Email: info@ssalanka.org | ssainfolanka@gmail.com